# කටපාඩම් පද - 8 ශ්‍රේණිය

## බයිබල් පාඨ

1) හිමි තුමන්ගේ ගිවිසුම හා ශික්ෂා පද පිළිපදින අයට එතුමන්ගේ සියලු මාවත් කරුණාවේ හා සත්‍යයේ මාවත් වනු ඇත
- **ගීතාවලිය** 25:10

2) ඔබේ රාජ්‍යය සදාකාලික ය, ඔබේ ආධිපත්‍යය ද සියලු පරම්පරාවල ම පවත්නේ ය. සමිඳාණෝ සියලු පොරොන්දු ඉටු කරන සේක. තමන් කරන සියල්ලේ දී මෙත් සිත් වඩන සේක. - **ගීතාවලිය** 145:13

3) හැම වේලේ ම හිමි තුමන්ට මම ප්‍රශස්ති ගී ගයමි. එතුමන්ගේ ගුණ වැණුම් මා මුවින් තොර නොවෙයි. - **ගීතාවලිය** 34:1

4) "එහෙත් කාලය සම්පූර්ණ වූ කල, දෙවියන් වහන්සේ ස්ත්‍රියකගෙන් උපත ලත්, ව්‍යවස්ථාව යටතේ උපන්, සිය පුත්‍රයාණන් එවා වදාළ සේක" - ගලාති 4:4

5) "මෙන්න, කන්‍යාවක් ගැබ්ගෙන පුතෙකු බිහිකරන්නී ය. උන් වහන්සේට එම්මානුවෙල් යන නාමය තබනු ඇත" - **මතෙව්** 1:23

6) "මෙසේ ඔව්හු එවක් පටන් දෙදෙනෙකු නොව එක් කෙනෙක් වෙති. එබැවින් දෙවියන් වහන්සේ එක් කළ අය මනුෂ්‍යයා වෙන් නොකෙරේවා" - **මතෙව්** 19:6

7) "පුරුෂයෙනි ක්‍රිස්තුන් වහන්සේ සභාවට ප්‍රේම කොට සභාව වෙනුවෙන් සිය දිවි පුද කළාක් මෙන් ඔබත් ඔබගේ භාර්යාවන්ට ප්‍රේම කරන්න" - **එපීස** 5:25

8) "සමිඳුන්ගේ තිර පෙම කිසි කලෙක පහ නොවන්නේ ය. එතුමන්ගේ දයාව කෙළවර නොවන්නේය" - **විලාප ගී** 3:22

## අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණය

9) ඔහුගේ එකම පුත්‍ර වූ අපගේ ස්වාමීන් වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි ද මම විශ්වාස කරමි - 2 **වගන්තිය**

10) ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආනුභාවයෙන් කන්‍යා මරියාවන්ගෙන් මිනිස් බව ගෙන ඔවුන් වහන්සේ මනුෂ්‍යයා වූ සේක
- 3 **වගන්තිය**